විදුර විද්‍යාලය - කොළඹ

4 වන ශ්‍රේණිය

සිංහල භාෂාව

- දුවේ පුතේ, පහත සඳහන් ශිෂ්‍ය සටහන් ඔබේ සිංහල ලිවීම පොතට පිටපත් කරන්න. ශිෂ්‍ය සටහන 01,02,03 ඡායා පිටපතක් ලෙස ගෙන අලවන්න.

## ළමා කවි, ගීත, කතන්දර

ශිෂ්‍ය සටහන 01

**පොත් කුරුල්ලා**

ඉස්කෝලේ නිවාඩුවට පොත් සාප්පුවේ
පොතින් පොතට පියඹා යම් හරි සැහැල්ලුවේ
තාත්තාගෙ කොටු කමිසයෙ උඩ සාක්කුවේ
බර අඩු වෙනවා දැක්ක ම ඇති කියා හිතේ

ඇතෙක් බරට තෑගි ලැබුණු පොත් ගොඩක් ඇතේ
පොතින් පොතට මං ගිය දුර දුටු කෙනෙක් නැතේ
කවි - රචනා - කතා - ගීත - ලියූ කොළ ගොඩේ
නමක් නැතත් කියවූ පොත් මතකයේ ඇතේ

පොතයි-නෙතයි-අතයි-හිතයි එකට එක් වෙලා
ඇඳේ වැටී පුටුවෙ ඇදී පොළොවෙ වැතිරිලා
තුරු සෙවණේ මල් සුවඳේ හීනයක් වෙලා
පිටු අතරින් ඉගිළෙමි පොත් කුරුල්ලෙකු වෙලා //

විපුලි නිරෝෂණී හෙට්ටිආරච්චි
සතුටු කෝච්චිය

අභ්‍යාසය 01

01. ළමයා පාසල් නිවාඩුවට යන්නේ කොහේද?

------------------------------------------------------------------------

02. 'පොතින් පොතට පියඹා යනවා' යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

------------------------------------------------------------------------

03. ඇතෙක් බරට තෑගි ලැබුණේ මොනවාද?

------------------------------------------------------------------------

ශිෂ්‍ය සටහන 02

පිපි කුසුම වදුලු සිඹිමින්
තුරු සිරස ළපලු අතරින්
එන ළහිරු කිරණ මෙතරම්
සොඳුරු නැත
රජ මැඳුරුවල නම් . . . //

නද සමඟ අනෙක සියොතුන්
දිය පහස සිසිල විඳිමින්
මඳ පවන හමන දසතින්
සොඳුරු නැත
රජ මැඳුරුවල නම් . . . //

රජ මැඳුර සිපිරි ගෙයකි
ගම සොඳුරු තිදස පුරකී
මෙම සුවය නොවිඳි පෙර දී
ලැබුම මගෙ සසර පෙර පිනකී . . . //

සිරි පැරකුම් චිත්‍රපටයෙන්

අභ්‍යාසය 02

01 ළා හිරු කිරණ ගලා එන්නේ කුමක් අතරින්ද?

............................................................................

02 මෙහි ‘ සියොතුන් ’ යනු කවුරුන්ද?

............................................................................

03 මෙම ගීතයේදී ‘රජ මැඳුර’ සමාන කර ඇත්තේ කුමකටද?

............................................................................

ශිෂ්‍ය සටහන 03

## කැකිල්ලේ රජතුමා නරින්ට කළ උපකාරය

එදා වැසි සහිත දිනයකි. කැකිල්ලේ රජතුමා දවසේ වැඩ කටයුතු නිම කර නින්දට ගියේ ය. හිටිහැටියේ ඇසුණු ශබ්දයක් නිසා රජතුමා අවදි විය. නරි සිය ගණනක් එකතු වී මහ හඬින් හූ කීම ඒ අධික ශබ්දයට හේතුව යි. ඒ බව නොදත් කැකිල්ලේ රජතුමා වහාම පුරෝහිතයා කැඳවී ය.

"පුරෝහිත මේ මහ රෑ ඇසුණු ශබ්දය කුමක් ද ? හූ කියන්නේ කවුරුන් ද? ඒ ශබ්දය මගේ නින්දට මහත් බාධාවකි." රජතුමා පුරෝහිතට පැවසුවේ ය.

රජතුමා පැවසූ දෙයට යටි සිතින් සිනාසෙමින් පුරෝහිත මෙසේ පිළිතුරු දුන්නේ ය.

"දේවයන් වහන්ස, ඒ හූ කියන්නේ නරි රැළකි. උන් කෑ ගසන්නේ වැස්සට තෙමී සීතලෙන් වෙවුලන නිසා ය. උන්ට නිවාස නැත. පෙරවීම සඳහා රෙදි ද නැත. නරි රැළ මෙසේ කෑ ගසා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ නිවාසත්, රෙදිපිළිත් ය."

රජතුමා නරි රැළ පිළිබඳ සොයා නොබැලීම ගැන කම්පාවට පත් විය. වහාම භාණ්ඩාගාරය භාර ඇමතිවරයා කැඳවී ය. මසුරන් දහසක් පුරෝහිතට ලබා දෙන ලෙස නියෝග කළේ ය.

"මේ මසුරන් දහස රැගෙන ගොස්, නරි රැළට අවශ්‍ය නිවාස සහ පෙරවීම සඳහා රෙදි ද වහා සපයනු" යැයි රජතුමා අණ කළේ ය.

පුරෝහිත මසුරන් පොදිය ද රැගෙන සතුටින් තම නිවසට ගියේ ය.

නරි රැළට පිහිට වීමට හැකි වීම පිළිබඳ ව රජතුමා අපමණ සතුටට පත් විය.

**අභ්‍යාසය 03**

01 මෙහි සඳහන් රජතුමාගේ නම කුමක්ද?

---------------------------------------------------------------------

02 මහ හඬින් හූ කීවේ කවුරුන්ද?

---------------------------------------------------------------------

03 රජතුමා පුරෝහිතට අණ කලේ කුමක් කිරීමටද?

---------------------------------------------------------------------